# බළන්ගොඩ නගර සභාව

## 2022-07-15 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.07.15**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-06-09 දිනැති මහා සභා වාර්තාව හා 2022-06-24 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-06-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-06-24 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2022-06-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-06-24 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, 2022-06-09 මහ සභා වාර්තාවේ (පිටු අංකය 22) මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් "එක්සත් ජාතික පක්ෂවලට අපව ඕන වුවත්" ලෙස පැවසූ බවට සඳහන් කර ඇති නමුත් එතුමා ප්‍රකාශ කලේ පක්ෂවලට අපව ඕන වුවත් යනුවෙන් බැවින් , එය "පක්ෂ" ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022-06-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-06-24 දින පැවති විශේෂ මහ සභා වාර්තාව ගරු සභාවේ සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා නිවේදන වාරය ආරම්භ කරමින් බළන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරයෙකු වන රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අත්හැර ඇති බවට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10 අ(1)(අ) වගන්තිය යටතේ දන්වමින් රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තේරීම්භාර නිලධාරී විසින් 2022-06-21 දිනැති අංක 2285/06 මඟින් අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කර ඇති බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පෙ.ව 10.09 ට සභාවට පැමිණෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පෙ.ව 10.10 ට සභාවට පැමිණෙන ලදී.**

**ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා පෙ.ව 10.12 ට සභාවට පැමිණෙන ලදී.**

- එමෙන්ම පවතින ආර්ථික අර්බුදය නිසා රාජ්‍ය වියදම් පාලනය කිරීම යටතේ සංවර්ධන කටයුතු සිදු කිරීම පසුබෑමකට ලක් වූ බවත්, දෛනික කම්කරුවන් සීමා කළ අතර බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ සේවය කරන දෛනික කම්කරුවන් දින 21 කට සීමා කර ඇති බවත් සියලු දෙනා රැක ගනිමින් ආයතනය පවත්වාගෙන යා යුතු අතර, ගෙවීම් කටයුතු සඳහා මුදල් නොමැති බැවින් ස්ථාවර තැන්පතුවලින් රු. ලක්ෂ 27 ක් ගැනීමට සිදු වූ බවත්, ටෙන්ඩර්කරුවන්ගේ ඉල්ලීම් මත මාසික ගාස්තු අඩු කිරීම නිසා සභාවේ ආදායම 50% කින් අඩු වී ඇති බවත් පැවසීය.

## 03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- පෙර පාසල් ගුරු පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා මාස 06 ක පෙර පාසල් ගුරු පුහුණුවක් ලබා ගත යුතු බවත්, ඒ සඳහා බළන්ගොඩ නගර සභාව යටතේ පවත්වාගෙන යනු ලබන පෙර පාසලක එම පුහුණුව ලබා ගැනීමට අවසර ලබා දෙන ලෙසත් ඉල්ලමින් බළන්ගොඩ, වෑගපිටිය, අංක 380/ඒ 01 ලිපිනයේ පදිංචි එච්.කේ. උදානි මධුෂාණි යන අය හා බළන්ගොඩ, වෑගපිටිය ලිපිනයේ පදිංචි ඩබ්.එච්. ලෂිකා දිල්ෂානි සොයිසා යන අය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා, මෙම අය වෙත අවශ්‍ය පුහුණු වීම් අවස්ථාව ලබා දීමට කටයුතු කරන අතර, ඒ වෙනුවෙන් කිසිදු ගෙවීමක් සිදු නොකරන බව හා පුහුණු සහතිකය පමණක් ලබා දෙන බව පවසන ලදී.

- තම උපාධිය සම්පූර්ණ කර ගැනීම සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මාස 06 ක පුහුණුවක් ලබා ගැනීමට අවසර ලබා දෙන මෙන් බළන්ගොඩ, කුමාරගම, පිරුවන පාර, අංක 150 බී/1 ලිපිනයේ පදිංචි ඊ.එම්.එන්.එන්. චන්ද්‍රවංශ යන අය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම අය ඇල්ලෙපොල විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූවෙක් වන අතර, පාසල් 3ආර් සමාජය ඔස්සේ විශාල වැඩ කොටසක් කළ අයකු වන බව ද එම නිසා ඒ සම්බන්ධවද සලකා බලා ඊ.එම්.එන්.එන්. චන්ද්‍රවංශ යන වෙත අවශ්‍ය පුහුණු වීම් අවස්ථාව ලබා දීමට කටයුතු කරන අතර, ඒ වෙනුවෙන් කිසිදු ගෙවීමක් සිදු නොකරන බව හා පුහුණු සහතිකය පමණක් ලබා දෙන බව පවසන ලදී.

- 2021 හා 2022 වර්ෂවලට අදාලව ගරු සභාපති හා මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ 2022-07-25 දිනට ප්‍රථම පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන ලෙස දන්වමින් එවා ඇති CLG/AD/1/3/8 හා 2022-06-30 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- වැසි කාලයේ දී නගර සභා ඔසු උයනෙහි එකතු වන ජලය කාණු පද්ධතියට ගලා යාමේ නිසි ක්‍රමවේදයක් නොමැති බැවින් කඩ කාමරවල පිටුපස බිත්තියට එම ජලය උරා ගන්නා බවද නිසි ක්‍රමවේදයකට අනුව ඔසු උයනේ කාණුවක් සකස් කර එම ජලය ප්‍රධාන කාණුවට එකතු කරන ලෙස ද ඉල්ලමින් ස්වශක්ති එකමුතු ව්‍යාපාරික සංගමය විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

වැඩ අධිකාරීතුමාගේ හා කාර්මික නිළධාරීතුමාගේ උපදෙස් මත අදාල කඩ හිමියන් විසින්ම කාණුව සකස් කර එම ගැටලුව විසඳා ගත යුතු බව සභාවේ මතය විය.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

අද දින ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

05:01 **ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

05:01:01 පොළ භූමියේ බුදු පිළිමය ඉදිරිපිට ඇති මස් කඩය වෙනුවෙන් ගන්නා ලද සභා තීන්දුව ක්‍රියාත්මක නොකරන්නේ මන්ද?

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව පිළිතුරු ලබා දෙමින් හිටපු ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් යවන ලද ලිපි තමන් විසින් පරිශීලනය කළ අතර, සම්බන්ධීකරණ කමිටුවේ දී මෙම ස්ථානයේ කුකුල් මස් අලෙවි කිරීම අශෝබන බව පැවසූ නමුත් නීතිය අනුව මෙය ඉවත් කරන ලෙස තමන්ට පැවසිය නොහැකි අතර, වෙළඳ බලපත්‍රයක් තවම ලබා දී නොමැති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් හිටපු ගරු ආණ්ඩුකාරතුමා විසින් සම්මත කළ සෞඛ්‍ය අතුරු ව්‍යවස්ථාව හා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කරන ලෙසත් නීත්‍යානුකූලව නගර සභාවේ බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරයක් පවත්වා ගෙන යා නොහැකි බවත් පැවසීය.

ගරු උප සභාපතිතුමා පැවසුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් වෙළඳ බලපත්‍රයක් ලබා දීම සුදුසු බවට නිර්දේශ කරන්නේ නම් ගරු සභාපති විසින් බලපත්‍රය දිය යුතු අතර, තමන් සිතන ආකාරයට බලපත්‍රයක් නතර කිරීමට සභාපතිතුමාට බලයක් නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, බුදු පිළිමය ඉදිරිපිට මස් කඩය ඉදි කළේ ද නැතිනම් මස් කඩය ඉදිරිපිට බුදු පිළිමය ඉදි කළේ ද යන්න විමසීය.

අදාල ස්ථානයේ කුකුල් මස් කඩය පවත්වාගෙන යාම සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පෙ.ව 10.26 ට සභාවට පැමිණෙන ලදී.**

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 සභාවේ වර්තමාන මූල්‍ය තත්ත්වය අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය මුදල් සඳහා මාසික ණය වාරිකය සහ පොළිය ගෙවීම අපහසු බැවින් ඉදිරි ණය වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක් (Grace period) ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ආධාර යටතේ බස් නැවතුම්පොළ සහිත වෙළඳ සංකීර්ණය හා වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය මුදල් සඳහා මාසික ණය වාරිකය හා පොළිය ගෙවීමට මසකට රු. 972,599.26 ක මුදලක් දැරිය යුතු නමුත් සභාවේ වර්තමාන මූල්‍ය තත්ත්වය සලකා බැලීමේ දී ණය වාරික ගෙවීම අපහසු වී ඇති අතර, ඉදිරි ණය වාරික ගෙවීම සඳහා මාස 06ක සහන කාලයක් (Grace period) ලබා දෙන ලෙස දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත ඉල්ලීමක් සිදු කිරීම වෙනුවෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව පැවසීය.

මේ සම්බන්ධව ගණකාධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ සිදු වූ නාය යාම හේතුවෙන් වගා කිරීමට නොහැකි වූ කුඹුර හා ඇල මාර්ගය නැවත වගා කිරීමට හැකි ආකාරයකට සකස් කර දීම සඳහා සභාවේ කැණීම් යන්ත්‍රය (Jcb Excavator) ලබා දුන් අතර, සිදු වූ අලාභය වෙනුවෙන් රු. 50,000.00 ක මුදලක් ඩබ්.පී විජේපාල යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ සිදු වූ නාය යාම නිසා ඩබ්.පී විජේපාල යන අයගේ ඉඩම් කොටසේ බෝතල් කටු හා අපද්‍රව්‍ය ඇති අතර එය ඉවත් කිරීම සඳහා දළ වශයෙන් රුපියල් 50,000.00 ක් පමණ වැයවෙන බවත්, අපද්‍රව්‍ය

ගලා යාම නිසා ජේ.එම්. සුගතදාස යන අයගේ කුඹුරු ඉඩම වගා කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවත් ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් දැනුම් දී තිබූ අතර, ඒ අනුව රු.50,000.00 ක මුදල ගෙවීමට සභාව කැමති වී තිබුණු නමුදු එම මුදල අදාල පිරිසිදු කර ගැනීම් සිදු කිරීමට ප්‍රමාණවත් නොවන බව පවසා ඩබ්.පී විජේපාල යන අය එම මුදල ප්‍රතික්ෂේප කර ඇති බව ද පසුගිය දිනක රු.50,000.00 කට ආසන්න මුදලක් වැය කර සභාවේ කැණීම් යන්ත්‍රය (Jcb Excavator) යොදවා ඇළ මාර්ගය සකස් කර දුන් අතර, එම නිසා කුඹුරේ ජලය ඉවත් වීම නිසා මුඩු බිමක් බවට පත්ව ඇති බව ද බෝතල් කටු ආදිය බිම් කොටා ඉවත් කිරීමට හැකි බැවින් එම කාර්යය සඳහා මෙම මුදල ගෙවන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, මෙම මුදල ලබා දීමෙන් පවතින නඩුවට අවාසියක් සිදු වන්නේ දැයි විමසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුවේ මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී වෙනත් නීත්‍යානුකුල පියවරක් හෝ වන්දි ඉල්ලීමක් නොකරන බවට අදාල අයගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමෙන් පසු මෙම මුදල ලබා දෙන බවයි.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ඩබ්.පී විජේපාල යන අයගෙන් මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී වෙනත් නීත්‍යානුකුල පියවරක් නොගන්නා බවට හා වන්දි ඉල්ලීමක් නොකරන බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමෙන් පසු සිදු වූ අලාභය වෙනුවෙන් රු. 50,000.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 2022-06-09 දිනැති මහ සභාවේ දී ගරු මන්ත්‍රීවරුන් යෝජනා කල පරිදි මොහාන් එල්ලාවල මාවතේ දොරවෙල ඔය හා ප්‍රධාන මාර්ගය අසල ඇති බිම් තීරුවෙන් කොටසක් මල්පෝච්චි හා පැල වෙළඳාම සඳහා බළන්ගොඩ, කිරිදිගල, වැලිහරනාව පාර, අංක 35/3 ලිපිනයේ ඒ.කේ.ඒ.නිශ්ශංක පත්ම කුමාර යන අයට සහ බළන්ගොඩ,රාස්සගල පාර, සුදර්ශනපුර, අංක 39 ලිපිනයේ එම්.කේ.ඩී. මුළුතියනගේ යන අයට ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ පැමිණිලි හා සංදේශ යටතේ ඉහත නම් සඳහන් අය විසින් මොහාන් එල්ලාවල මාවතේ දොරවෙල ඔය හා ප්‍රධාන මාර්ගය අසල ඇති බිම් තීරුවෙන් කොටසක් මල්පෝච්චි හා පැල වෙළඳාම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබුණු අතර, එහි දී ගත් තීරණය මත යෝජනාවක් වශයෙන් අද දින ඉදිරිපත් කළ බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා පැවසුවේ මෙම කොටස නගර සභාවෙන් බදු දෙන බවට පුවරුවක් එම ස්ථානයේ සවි කිරීමෙන් පසු ලැබෙන විවෘත ඉල්ලීම් අනුව සුදුසු ක්‍රමවේදයකින් ලබා දීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා සඳහන් කළේ ටෙන්ඩරයක් මගින් තෝරා ගනු ලබන අයකුට මෙම ස්ථානය ලබා දෙන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කවුරුන් හෝ ව්‍යාපාරයක් සිදු කිරීමට ඉල්ලන්නේ නම් එය ලබා දිය යුතු අතර, බලහත්කාරයෙන් හදා ගතහොත් එය සභාවෙන් නතර නොකරන බව ද නගර සභාවට අයත් දේපල ගණනය කළහොත් අද වන විට එම ප්‍රමාණය අඩු වී ඇති බව ද වෙනත් අය එම ඉඩම් භුක්ති විඳින අතර, සභාවට කිසිදු ආදායමක් නොලැබෙන බව ද ස්වයං රැකියාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක් නිසා මෙය ලබා දීමේ ගැටලුවක් නොමැති අතර ඉන් සභාවට යම් ආදායමක් ලැබෙන බව ද බෙදීමක් අවශ්‍ය නම් බෙදීමකට ගොස් කැමැත්ත අකමැත්ත විමසා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසුවේ මෙම පුද්ගලයා මෙම ස්ථානය පළමුවෙන්ම ඉල්ලූ අයෙක් වන අතර, වාර්ෂික බදු ගිවිසුමකට අනුව ලබා දුනහොත් සභාවට අවශ්‍ය මොහොතක නැවත මෙය ලබා ගැනීමට හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, මෙම දෙදෙනාට ස්වයං රැකියාවක් සඳහා මෙම ස්ථානය ලබා දීමට ඇති සුදුසුකම, පදනම හා ඔවුනගේ ආර්ථික පසුබිම කුමක් දැයි විමසීය.

එමෙන්ම මෙහි සඳහන් පුද්ගලයන් දෙදෙනාම තමන් හොඳින් දන්නා අතර,ඥාතීන් වන බව ද එම්.කේ.ඩී. මුළුතියනගේ යන අය බුලත්ගම සුපර් ස්ටෝර්ස් අයිතිකරු වන අතර, මුදල් පොලියට ලබා දෙන ව්‍යාපාරිකයෙක් හා වැවේවත්ත තට්ටු තුනක පමණ විශාල ගොඩනැගිල්ලෙහි අයිතිකරු බව ද සභාවේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු තමාට පැවසූ පරිදි ගරු සභාපතිතුමාගේ දියණිය විවාහ වීමට සිටින පුද්ගලයා බව ද බලහත්කාරයෙන් ඉදි කිරීමක් කළහොත් ඉවත් කිරීමට නොහැකි එම හේතුව නිසාදැයි සැකයක් පවතින බව ද අනෙක් පුද්ගලයා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ සහ තමාගේ හිතවතෙක් වන අතර, කොරියාවේ සිට කෝටි ගණන් මුදල් රැගෙන පැමිණ ව්‍යාපාරවල යෙදෙන මුදල් පොලියට ලබා දෙන තරුණයෙක් බව ද පසුගිය කාලයක ජෙනරේටර් කාමරය විකුණන ලද්දේ ද එම පුද්ගලයාට බව ද රාජකාරියේ දී සහෝදරකම්,ඥාති හිතවත්කම් තමාගේ නොමැති බව ද පවසන ලදී.

එමෙන්ම ගරු සභාපති ඩබ්.එම්.එන්.පී. වීරසිංහ මැතිතුමා මෙම ස්ථානය එම පුද්ගලයාට ලබා දීමට සහය දක්වන්නේ පොළේ මුර කුටිය තමාට ලබා ගැනීමේ අදහසින් බව ද බලහත්කාරයෙන් මිනිසුන් සභාවේ ඉඩම් ප්‍රයෝජනයට ගන්නා බව පැවසුව ද තමාගේ පාලන කාලය වන පසුගිය අවුරුදු 04 ක කාලය තුළ එසේ නොවුණු අතර, දැන් එසේ සිදු වන්නේ නම් ගරු සභාපතිතුමාට ඒ සඳහා තීරණයක් ගත හැකි බව ද පැවසීය.

වැඩිදුරටත් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා මහජන දේපල මංකොල්ල නොකා සිටීමට බැරි ඇයි දැයි විමසූ අතර, මෙය සමාජගත වුවහොත් සහය දැක් වූ ගරු මන්ත්‍රීවරුන්ට පාරට බැසීමට පවා නොහැකි වන බව ද අද රට තුළ අරගලයන් නිර්මාණය වී ඇත්තේ ද මෙවැනි ක්‍රියා නිසා බව ද දේශපාලනයෙන් වයසක පුද්ගලයන් ඉවත් වී

තරුණයන්ට ඉඩ දිය යුතු බව ද මෙම සභාවේ තමන් අවස්ථා දෙකක් සිටි අතර, එම කාලය පවා ප්‍රමාණවත් බව ද අවුරුදු 25-30 ක් පමණ කාලයක් සභාවේ සිටින අය ඇති බව ද නව මන්ත්‍රීවරුන් හැරුණු විට අනෙකුත් අය සභාවේ දේපල විකුණා පවත්වාගෙන යාම සම්බන්ධ වාර්තා තොරතුරු තිබෙන අතර, ඒ සඳහා කිසිවක් නොකරන ලද්දේ තම පියා කියාදුන් විනය නිසා බව ද මෙම ක්‍රියාමාර්ග ගනු ලබන්නේ කිසිවෙකුටත් පහර ගැසීමට නොව සමාජයේ රටේ හා සියලු දෙනාගේ ආරක්ෂාව සඳහා බව ද මහජන දේපල සූරා කෑමට තමන් විරුද්ධ අතර මෙම පුද්ගලයන් දෙදෙනාට මෙම ස්ථානය ලබා දුනහොත් ගඟ දිගේ සම්පූර්ණ තීරුවම මාසයක් යාමට පෙර මිනිසුන් විසින් බෙදා ගැනීමට ඉඩ පවතින බව ද මෙම සියලු කරුණු ප්‍රකාශ කරනු ලැබුවේ තම තමන් තුළ යම් කිසි වැරදි අදහසක් තිබුණේ නම් එම අදහස් දුරු වී ආත්ම ගරුත්වය හා ආත්ම අභිමානය ආරක්ෂා වීමට පරිසරය සකස් කර දීමට බව ද අවශ්‍ය නම් බෙදීමකට යා හැකි අතර, එසේ නොමැති නම් මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරන බව ද පැවසීය.

නැවත වරක් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ඒ.කේ.ඒ.නිශ්ශංක පත්ම කුමාර යන අය කොරියාවේ සිට පැමිණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ජෙනරේටර් කාමරය ඉල්ලූ අතර,සභාවේ අනුමැතියකින් එය පවරා දුන් නමුත් විකිණීමක් කළේ හෝ කිසිදු මුදලක් පෞද්ගලිකව ලබාගෙන නොමැති බව ද පාඩු ලබන බැවින් එම ස්ථානයෙන් ඉවත් වී වෙනත් ව්‍යාපාරයක යෙදුණු අතර, පසුගිය කොරෝනා වසංගතය නිසා එම ව්‍යාපාර කඩා වැටුණු බව ද ඒ සඳහා බැංකුවෙන් ලබා ගත් ලක්ෂ 40 ක ණය මුදල් ගෙවීමට සිදුව ඇති බව ද ඔහු පාරට බසින තත්ත්වයක පත්ව ඇති බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ මෙම ස්ථානයේ නීත්‍යානුකූල තත්ත්වය ගැන නිශ්චිතව කිව නොහැකි අතර, මෙම යෝජනාව අද දින සම්මත වුවහොත් තමන් එය පළාත් පාලන කොමසාරිස් හා අනෙකුත් අදාල නිළධාරීන්ට යොමු කර උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විවිධ චෝදනා හා තර්ජනයන් එල්ල වන බැවින් නිසි ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙස පවසන ලදී.

මේ සම්බන්ධයෙන් ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව ඉඩමේ නීත්‍යානුකූල තත්ත්වය තහවුරු කර ගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සභාව විසින් තීරණයක් ගැනීම සුදුසු බව සභාවේ මතය වූ බැවින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

06:01:04 සභාව සතු වාහන සේවා කිරීම සඳහා ස්ථානීය මිල කමිටුවක් පත් කිරීම හා ඒ අනුව අදාල දිනයේ පවතින වෙළඳපොළ මිලට අවශ්‍ය සේවා සිදු කර ගැනීම සඳහා අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සභාව සතු වාහන අදාල මීටර පැය ගණන සම්පූර්ණ වූ පසු 2022-06-30 දින සිට ඉදිරි මාස 06 ක කාලයකට සේවා කිරීම සඳහා වාහන සේවා සඳහා

ලියාපදිංචි කේ.ඒ. ඉංජිනියරින් ඇන්ඩ් කේ.ඒ. ඔටෝ ක්ලීන් ආයතනය හා රිෂානා සර්විස් ආයතනය වෙතින් මිල ගණන් ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලැබුව ද වර්තමාන වෙළඳපොළ තත්ත්වය අනුව සේවාවන්හි මිල ගණන් නිරන්තරව වෙනස් වීමට ලක් වන බැවින් සම්මත මිල ගණන් ඉදිරිපත් කිරීමට නොහැකි බව එම ආයතන වෙතින් දන්වා ඇති බව ද ඒ අනුව ස්ථානීය මිල කමිටුවක් පත් කර එමඟින් අදාල දිනයේ පවතින වෙළඳපොල මිලට අවශ්‍ය සේවා සිදු කර ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ද පවසන ලදී.

ඒ අනුව ස්ථානීය මිල කමිටු සාමාජිකයන් වශයෙන්,

i. නාගරික ලේකම්, ඩී.එම්.ජේ.යූ. ධර්මරත්න මහතා
ii. ගණකාධිකාරී, එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා
iii. වැඩ අධිකාරී, පී.ඩබ්.එස්. සේනාධීර මහතා

සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 සුසාන භූමියේ මිනී භූමදානය කිරීම සඳහා වලවල් කැපීම සභාව මඟින් සිදු කිරීම හා ඒ සඳහා රු. 5,000.00 ක මුදලක් අය කිරීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ආදාහනාගාරවල මිල ගණන් ඉහළ යාම නිසා භූමදානය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්නට ලැබෙන අතර,පසුගිය දිනක රු.8,000.00 ක් වැනි මිලකට වල කපා දී ඇති බවට තොරතුරු ලැබී ඇති බැවින් රු.5,000.00 ක මුදලක් සභාවේ තැන්පත් කළ පසු සභාවේ කම්කරුවන් දෙදෙනෙකු යොදවා වල කපා දීම මඟින් මිනිසුන් හට යම් සහනයක් සලසා දිය හැකි බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා සඳහන් කළේ ඇතැම් මරණවල දී ඥාති හිතමිත්‍රාදීන් විසින් වල කැපීමේ කටයුතු සිදු කරන බැවින් එවැනි මරණවල දී සභාව විසින් මුදල් ලබා ගැනීම නොකළ යුතු අතර,ඔවුන් සඳහා එම කාර්යය සිදු කර ගැනීමට අවස්ථාව සලසා දිය යුතු බවයි. එමෙන්ම සුසාන භූමිවල භූමියේ ස්වභාවය එකිනෙකට වෙනස් බැවින් ඒ ඒ සුසානභූමි සඳහා මිල ගණන් වෙනස් කළ යුතු බව පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා පැවසුවේ ඒ ඒ සුසාන භූමි සඳහා එකිනෙකට වෙනස් මිල ගණන් නියම කිරීම නොකළ යුතු අතර, සභාවේ අධීක්ෂණය මත එම කාර්යයන් සිදු කිරීම සුදුසු බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 බළන්ගොඩ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අක්කර 01 ක භූමි ප්‍රමාණයක් සඳහා කොම්පෝස්ට් පොහොර ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් තම ආයතනික භූමියේ අක්කර 01 ක පමණ ප්‍රමාණයක වගා කිරීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා කාබනික පොහොර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව පැවසීය.

මේ සම්බන්ධව ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව මෙම වගාවන් සඳහා අවශ්‍ය කරන කොම්පෝස්ට් ප්‍රමාණය ගණනය කර ව්‍යාපෘති යෝජනාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලබා ගැනීමටත්, නිළධාරී අධීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව පොහොර ලබා දීම පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 ඉන්ධන අර්බුදය හේතුවෙන් 2022 ජූනි මාසයේ බස්රථ ධාවනය අඩු වූ බැවින් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ දී ජූනි මාසය සඳහා සහනයක් ලබා දෙන ලෙස අදාල ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවත්නා ඉන්ධන අර්බුදය හේතුවෙන් බස් රථ ධාවනය අඩු වූ බැවින් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ දී 2022 ජූනි මාසය සඳහා වන ගාස්තු අඩු කර දෙන මෙන් ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් කර ඇති අතර, දෛනික බස් ධාවනය බස් රථ 90 ක් වන නමුත් ජුනි මස බස් රථ ධාවනය වී ඇත්තේ 42% ක් බව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් දැනුම් දී ඇති බව පවසන ලදී.

එමෙන්ම මෙසේ සහන දීම තුල සභාවේ ආදායම් තත්ත්වය පහළ මට්ටමකට පත්ව ඇති බව ද ඉන්ධන වෙනුවෙන් සභාව විසින් මසකට රු. ලක්ෂ 05 ක් වැය කළ නමුත් ඉන්ධන මිල ඉහළ යාම නිසා මේ වන විට එය ලක්ෂ 16 ක් දක්වා වැඩි වී ඇති බව ද ආදායම අහිමි වීම නිසා සභාව විශාල අපහසුතාවයකට පත්ව ඇති බව ද වැඩිදුරටත් පැවසීය.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ දී 2022 ජූනි මාසය සඳහා වන ගාස්තුවලින් 75%ක් අය කිරීමටත්, මාසික කුලී කපා හැරීම්, අඩු කිරීම් ආදී සහන රැසක් සභාව විසින් අවස්ථා ගණනාවක දීම ලබා දී ඇති බැවින් නැවත සහන ලබා දිය නොහැකි බව දන්වමින් ලිපියක් අදාල

ටෙන්ඩර්කරු වෙත ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 ඉන්ධන අර්බුදය හේතුවෙන් 2022 ජූනි මාසයේ රථ වාහන ධාවනය අඩු වූ බැවින් රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ දී ජූනි මාසය සඳහා සහනයක් ලබා දෙන ලෙස අදාල ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති අතර, ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ දී 2022 ජූනි මාසය සඳහා වන ගාස්තුවලින් 50%ක් අය කිරීමටත්, මාසික කුලී කපා හැරීම්, අඩු කිරීම් ආදී සහන රැසක් සභාව විසින් අවස්ථා ගණනාවක දීම ලබා දී ඇති බැවින් නැවත සහන ලබා දිය නොහැකි බව දන්වමින් ලිපියක් අදාල ටෙන්ඩර්කරු වෙත ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 පදික කඩ කාමර අංක 185/19 දරන කඩ කාමරය එච්.අයි.අනුලා ගීතාංජලී යන අයට බදු දී ඇති අතර, ඇය විසින් මෙම කඩ කාමරය ගමගේ දයා කාන්ති යන අයට ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ගමගේ හේමා දයා කාන්ති යන අයට අංක 185/19 දරන කඩ කාමරය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පදික කඩ කාමර අංක 185/19 දරණ කඩ කාමරය එච්.අයි.අනුලා ගීතාංජලී යන අය විසින් බදු ගෙන පවත්වාගෙන යන අතර, ඇයගේ අසනීප තත්ත්වය හේතුවෙන් තවදුරටත් එම කඩ කාමරය පවත්වා ගෙන යාමට නොහැකි බව 2022-06-15 දින ලිපියකින් දන්වා ඇති බව ද එම නිසා මෙම කඩ කාමරය ජාතික හැඳුනුම්පත් අංක 746780303V දරණ ගමගේ හේමා දයා කාන්ති යන අයට ලබා දීමට ඇය විසින් ඉල්ලීමක් කර ඇති බැවින් ගාස්තු අය කරගෙන ගමගේ හේමා දයා කාන්ති යන අයට අංක 185/19 දරන කඩ කාමරය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට මෙම යෝජනාව ඉදිරිපත් කළ බව පැවසීය.

එමෙන්ම පළාත් පාලන කොමසාරිස්, ප්‍රජා සංවර්ධන නිළධාරී ගාමිණී මහතා මෙන්ම ලේකම්තුමා විසින් පදික කඩ කාමර පැවරීම කළ නොහැකි බව හා මීට පෙර හිටපු ගරු සභාපතිතුමා ලබා ගෙන තිබූ සභා තීරණය වැරදි බවට පැවසූ නමුත් තමන් විසින් එම

ක්‍රමවේදයම අනුගමනය කරමින් ගාස්තු අය කරගෙන පැවරීමට කටයුතු කරන බව ද වැඩිදුරටත් පවසන ලදී.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ සභාවට ආදායමක් අවශ්‍ය නමුත් නීත්‍යානුකූල ක්‍රමවේදයක් නොතිබුණු නිසා සභාවට ආදායමක් වක්‍රාකාරව ලබා ගැනීම උදෙසා තමන් කටයුතු කළ බවයි.

ඒ අනුව ගාස්තු අය කරගෙන ගමගේ හේමා දයා කාන්ති යන අයට පදික කඩ කාමර අංක 185/19 දරන කඩ කාමරය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 බළන්ගොඩ තානායමේ ගිවිසුම් අංක 04 හා අංක 11 යටතේ ගිවිසුම් අණ පනත් හා කොන්දේසි කඩ කිරීමක් සිදු වී ඇති බැවින් තානායම සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සහකාර සුරාබදු කොමසාරිස්තුමන්ගේ අංක කා.ආ.වා. 04/2022 (බළන්ගොඩ) සහ 2022-03-28 දිනැති සහ කා.ආ.වා. 04/2022 (බළන්ගොඩ) සහ 2022-06-06 දිනැති ලිපියට අනුව බ්‍රැන්ඩි ලීටර් 2.250 ක් ගිණුම් පොතට ඇතුලත් නොකිරීම හේතුවෙන් තානායම වෙත නිකුත් කරන ලද රට බීම බලපත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය වී ඇති බවත්, ඒ වෙනුවෙන් රු.25,000.00 ක දඩ මුදලක් නියම කර අය කරගෙන ඇති බවත් පවසන ලදී.

ඒ අනුව තානායමේ ගිවිසුමට අනුව ගිවිසුම් අංක 04 හි එන අලාභහානි යටතේ ඇති බදු ගැනුම්කරු විසින් සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාවක් හෝ නඩු නිමිත්තකට විෂය වන සිද්ධියක් සම්බන්ධයෙන් කවර හෝ සිද්ධියක් සිදු වුවහොත් ඉන් ඔබ්බට බදු කරුට ඇති බදු අයිතිය සම්පූර්ණයෙන්ම අහෝසි වෙන බව දක්වා තිබෙන අතර, අංක 11 යටතේ ගිවිසුම් අණ පනත් හා කොන්දේසි කඩ කිරීමක් උල්ලංඝනය කිරීමක් සිදු කිරීම වරදක් වන අතර, කරන ලද අවසන් වරදේ ස්වභාවය අනුව ගිවිසුම අවලංගු කර නැවත සභාවට පවරා ගැනීමට අදාල සම්පූර්ණ බලය බළන්ගොඩ නගර සභාව සතු බව දක්වා ඇති බව ද ඒ අනුව තානායම සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් සභාව වෙත යොමු කළ බව ද ගරු සභාපතිතුමා පැවසීය.

එමෙන්ම 2017 වර්ෂයේ සිටම තානායම් බදුකරු විසින් ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති අතර, 2020 හා 2021 වර්ෂයේ විවාහයන් 17 ක් වෙනුවෙන් ලබා ගෙන තිබූ අත්තිකාරම් හේතුවෙන් එම උත්සව 2022 වර්ෂයේ පැවැත්වීම උදෙසා තානායමේ ටෙන්ඩර් කාල සීමාව වසරකින් දීර්ඝ කර ලබා දී තිබූ බව ද තානායම් කුලිය අඩු කරන ලෙස නිරන්තර ඉල්ලීම් ලැබෙන අතර, ඒ අනුව මේ වන විට රුපියල් ලක්ෂ 10 කට අධික ප්‍රමාණයක් සභාවෙන් අඩු කර දී ඇති බව ද පවතින අර්බුදයන් හමුවේ යම් යම් ගැටලු පවතින නමුත් තානායම් ටෙන්ඩර්කරු

වෙනුවෙන් සභාව කැපකිරීම් කර ඇති බව ද මේ නිසා සභාවේ ආදායම පහත වැටී ඇති බව ද දිගින් දිගටම සහන ඉල්ලීම තුල එතුමා මෙම තානායම අපහසුවකින් පවත්වාගෙන යන බව පෙනී යන බව ද විවාහ උත්සවයන් 17 සිදු කර අවසන් නම් පාඩු ලබමින් තානායම පවත්වාගෙන යාමේ තේරුමක් නොමැති බව තමාගේ මතය බව ද මේ සම්බන්ධව සාකච්ඡා කර සභාවෙන් තීරණයක් ගන්නා ලෙස ද වැඩිදුරටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසුයේ මෙය තානායම් ටෙන්ඩර්කරු විසින් සිදු කළ වරදක් නොව මාස 03කට වරක් නීත්‍යානුකූලව දඩයක් දීමට සිදුවන බවයි.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් 2015 වසරේ වෙසක් පෝය දින තානායමේ මත්පැන් අලෙවි කිරීම නිසා රු. ලක්ෂ 16 ක් පමණ සභාවට ගෙවීමට සිදු වූ අතර, එවක කළමනාකාරීත්වය වෙනස් නමුත් එකම පවුලේ අය විසින් තානායම කළ බව ද වර්තමාන ටෙන්ඩර්කරු සහ පවුලේ අය මාසයකට දෙතුන් වතාවක් විනෝද චාරිකා යන අතර, හෝටල්වල නවාතැන් ගනිමින් වියදම් කරන බවද වියදම් වැඩි වීම මත ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවී ඇති බව ද පසුගිය ක්‍රිකට් තරගාවලිය කහ වර්ණයෙන් සැරසී නැරඹීමට ගොස් සිටි බව දක්නට ලැබුණු බව ද, තමන් මහජන දේපල නීත්‍යානුකූලව හෝ අනියම් ලෙස ලබා ගෙන එමගින් උපයන්නේ නැති බව ද අප මහජන දේපලවල භාරකාරයෝ මිස අයිතිකාරයන් නොවන බව ද තානායමේ ආදායම අඩු විය නොහැකි අතර මීට පෙර අවස්ථාවල දී සහන ලබා දීම වැරදි බව ද පොදුවේ සිතා තීරණ ගත යුතු අතර හිටපු ගරු සභාපතිතුමාට ගෞරවයක් වශයෙන් එම තීරණ ගත් නමුත් තානායම කරගෙන යාමේ අපහසුතාවයක් එම ටෙන්ඩර්කරුට පවතින්නේ නම් හා විවාහ උත්සවයන් 17 අවසන් කර ඇත්නම් තානායම සභාවට පවරාගෙන සභාවෙන් පවත්වාගෙන යාම හෝ නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බව ද එසේ නොමැති නම් නරක පූර්වාදර්ශයක් සමාජයට ලැබෙන අතර, ගනු ලබන තීරණ නිසා අනාගතයේ දී වන්දි ගෙවීමට සිදු විය හැකි බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා නැවත වරක් අදහස් දක්වමින් 2022 ජූලි මස සිට දෙසැම්බර් මස දක්වා හෝ රටේ පවතින අර්බුදකාරී තත්ත්වය පහව යනතෙක් තානායමේ මාසික කුලිය රුපියල් එක්ලක්ෂ පනස්දහස බැගින් ගරු සභාව වෙත ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් තානායම් ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් කර ඇති බව පැවසීය.

මෙහි දී ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් රට තුළ පැන නැඟී ඇති තත්ත්වය මත සෑම ව්‍යාපාර ස්ථානයකම ගැටලු මතු වී ඇති බැවින් මෙම සහනය ලබා දීම සුදුසු බව ද තානායමේ මුදල විශාල මුදලක් වන නිසා එය කැපී පෙනෙන නමුත් අනෙකුත් අය සඳහා ලබා දෙන්නේ නම් මෙම අයට ද සහන දිය යුතු අතර එසේ නොමැති නම් සියලුම දෙනාගේ සහන නතර කරන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා මේ සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් පවසා සිටියේ රටේ පවතින තත්ත්වය හමුවේ ආයතනවල ව්‍යාපාර කටයුතු අඩාල වී ඇති අතර, නව ජනාධිපති හා අගමැති කෙනෙකු යටතේ රට යථා තත්ත්වයට පත්වුවහොත් මාසික කුලිය ගෙවීමේ ගැටලුවක් නොමැති බව ද ජල විදුලි බිල්පත් සමඟ දැනට මාසයකට ලක්ෂ 05 ක් හෝ 06 ක් ගෙවීමට සිදුව ඇති බව ද පවතින හිඟ මුදල් ඉදිරියේදී ගෙවන අතර, එම දරුවන් පවුල්

ජීවිතය සතුටින් ගත කරන බව ද තමන් වෙනුවෙන් මාසයකට බෙහෙත් සඳහා රු.30,000.00 ක් ලබා දෙමින් දෙමව්පියන්ට සලකන බව ද ව්‍යාපාර සමග දරුවන් ගැන කතා නොකරන ලෙස ද හිටපු ගරු සභාපතිතුමා විසින් නගර සභාවේ වාහනය අවුරුදු 04 ක් තිස්සේ විනාශ කර දැමූ බව ද සභාවෙන් ලක්ෂ 16 ක් ගෙවීමට සිදු වූයේ නිළධාරීන්ගේ වරදින් බව ද කසළ ටෙන්ඩරය ඇතුළු අනිකුත් කඩ හා ටෙන්ඩර්කරුවන් සඳහා සහන ලබා දුන් බැවින් මෙම ව්‍යාපාරය සඳහා ද සහන ලබා දෙන ලෙස ද එසේ නොමැති නම් අනිකුත් අය සඳහා ද සහන ලබා නොදෙන ලෙස ද පැවසීය

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පැවසුවේ ගිවිසුම් කොන්දේසි කඩ කරමින් සහන මත තානායම පවත්වාගෙන යාම සම්බන්ධව තම විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, තානායම සභාවට පවරාගෙන සභාවෙන් පවත්වාගෙන යාම හෝ නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවට තමන් යෝජනා කරන බවත් ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ අදහස වූයේ අවසාන වශයෙන් තරයේ අවවාද කරමින් හා සහන ලබා දෙන අවසාන අවස්ථාව මෙය වන බව සඳහන් කරමින් ලිපියක් පළාත් පාලන කොමසාරිස්ට පිටපත් සහිතව තානායම් ටෙන්ඩර්කරු වෙත ලබා දීම සුදුසු බවයි.

මේ සම්බන්ධව ඇති වූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව මින් ඉදිරියට ගිවිසුම් කොන්දේසි කඩ කිරීමක් සිදු වුවහොත් තානායම සභාවට පවරා ගන්නා බවට හා මාසික කුලී කපා හැරීම්, අඩු කිරීම් ආදී සහන රැසක් සභාව විසින් අවස්ථා ගණනාවක දීම ලබා දී ඇති බැවින් ඉදිරියේ දී තානායම් මාසික කුලී අඩු කිරීම තවදුරටත් කළ නොහැකි බව සඳහන් කරමින් පළාත් පාලන කොමසාරිස්තුමාට පිටපත් සහිතව තානායම් ටෙන්ඩර්කරු වන එරික් සිසිල් මහතාට ගිවිසුම් කොන්දේසි අනුව තරයේ කටයුතු කරන මෙන් අවසාන වශයෙන් අවවාද කිරීමේ නිවේදනයක් නිකුත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 6442/ඉඩම් හා අලාභ නඩුව (ක්‍රීඩා පිටිය සම්බන්ධව) සඳහා පෙනී සිටීමට ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ පී. දයාරත්න මහතාගේ සේවය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම නඩුව සඳහා නීතිඥ එස්.එම්. චන්ද්‍රසේකර මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ පී. දයාරත්න මහතාගේ සේවය ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇති බව ද මීට පෙර නඩු අංක 3089 ඉඩම් නඩුව සඳහා මෙම දෙපල සභාව වෙනුවෙන් පෙනී සිට ගාස්තුවකට යටත්ව නඩුව නිශ්ප්‍රභා කිරීමට කටයුතු කර ඇති බව ද මේ සම්බන්ධව වැඩි අවබෝධයක් සහිත නීතිඥ දෙපලක් බැවින් මෙම නඩුවේ ඉදිරි කටයුතු සඳහා මෙම නීතිඥවරුන් දෙදෙනාගේ සේවය ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 දූනට ගබඩාවේ පවතින වරක් පාවිච්චි කළ ටයර් නැවත පිරවීම සඳහා (රීබිල්) සහා අනුමැතිය ලබා ගැනීම

| ටයර් වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 700 x 16 | 06 |
| 600 x 16 | 09 |
| 650 x15 | 02 |
| 12.4 x 28 | 02 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ප.ව 12.20 ට සභාවෙන් පිටවන ලදී.

**07. මන්ත්‍රී යෝජනා**

07:01 **ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07:01:01 නගරයේ උසාවිය අසල ඩිෆරන්ට් ආයතනය ඉදිරිපිට මාර්ග සංවර්ධන අධිකාරියට අයිතිය ඇති කාණුව මත කොන්ක්‍රීට් තහඩු මට්ටම් දෙකක් ඇත. පදිකයන්ට හිසරදයක්ව පවතින මෙම ස්ථානය එකම මට්ටමකට ගෙන ඒමට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ලිපියක් යවා එම කටයුත්ත කර දීම

07:01:02 නම් කරන ලද ලංකා බැංකු මාවතට නාම පුවරුවක් සවි කර දෙන ලෙස ඉල්ලීම

07:01:03 ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කිරීමෙන් පසුව තීරණය කරන ලද මර්කන්ටයිල් හංදියේ (රා කඩේ හංදිය) රියදුරන්ට අසාධාරණයක් නොවන පරිදි ඉදිරිපත් කල ක්‍රමවත් සැලැස්මට අනුව වෙනස් කර දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර ලිපි යවා එම කටයුත්ත කර දීම

07:01:04 නව පොළ භූමියේ ගඟ අන්තයේ ඇවිදින මංතීරුව අසල මංතීරුවට ඇතුල්වන ස්ථාන දෙකට ගේට්ටු දමා දීම

07:01:05 නව පොළ භූමියේ ගඟ අන්තයේ ඇවිදින මංතීරුව නිසා ඉදි කරන ලද ජලය පිටවන ගලි වලවල් තුනට කොන්ක්‍රීට් තහඩු දමා ආවරණය කිරීම

07:01:06 නගරයේ වසා දමා ඇති සතොස ආයතනය නැවතත් ජනතාවට සේවය සැලසීම වෙනුවෙන් සතොස පාලන අධිකාරියට විවෘත කිරීමට බල කර ලිපියක් යැවීම

07:01:07 සිමෙන්ති ප්‍රශ්නය උග්‍රව පැවතියක් මහජන පොළ භූමිය තුල පිහිටි මාළු කඩ අසල කාණුව කොන්ක්‍රීට් තහඩු දමා ආවරණය කර එම ස්ථානය අනාරක්ෂිත බවෙන් මුදා දීම

07:01:08 නව බස් නැවතුම්පළ සහ නව මහජන පොළ යා කරන විකල්ප මාර්ගය පොළේ වෙළඳාම් කරන සුළු ව්‍යාපාරිකයන් ගැන සිතා හැකි ඉක්මනින් තනා දීම (මෙය කර්මාන්ත කමිටුවේ අනුමත වූවකි)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙම යෝජනා සම්බන්ධව අවධානය යොමු කර ඉටු කර දෙන ලෙස ද නව බස් නැවතුම්පළ සහ නව මහජන පොළ යා කරන විකල්ප මාර්ගය පස්වලින් සකස් කළ හැකි බැවින් වැඩි වියදමක් නොයන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් හුණුකුඹුර මාර්ගයේ වලවල් වසන ලෙස යෝජනා ඉදිරිපත් කළ නමුත් එය ඉටු නොවූ බව ද අමුද්‍රව්‍ය පවා සපයා දුන් අතර යෝජනා ක්‍රියාත්මක නොවන්නේ නම් යෝජනා ලබා දීමේ ඵලක් නොමැති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසූවේ බස් නැවතුම්පළ වතුර බැස යන කාණුවේ යකඩ දිරා ඇති බැවින් අවදානම් තත්ත්වයකට පත්ව ඇති නිසා ඉක්මනින් එය සකස් කරන ලෙසයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

07:02:01 වර්තමාන තත්ත්වය හමුවේ ගෙවතු වගා කිරීම සඳහා මහ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා බළන්ගොඩ ඉරිදා පොළ භූමියේ කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ මහජන පොළෙහි ගැමුණු සුභ සාධක සමිතියට ලබා දී තිබූ කඩ කාමරය කොම්පෝස්ට් අලෙවි කිරීම (කි.ග්‍රෑ. 10 සහ 05 මිටි) සඳහා ලබා දෙන බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ප.ව 12.25 ට සභාවෙන් පිටවන ලදී.**

**07 :03 ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

07:03:01 කෝපිවත්ත මාර්ගයේ සිට එගොඩ හුණුකුඹුර දක්වා අතුරු මාර්ගය එක්සත් මාවත නමින් නම් කිරීමට යෝජනා කිරීම

07:03:02 කෝපිවත්ත මාර්ගයේ කාහිංගල මහතාගේ නිවස ළඟ අතුරු මාර්ගය කාණුව සමඟ මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් කෝපිවත්ත මාර්ගයේ සිට එගොඩ හුණුකුඹුර දක්වා අතුරු මාර්ගය සඳහා නමක් නොමැති නිසා ලිපි පවා නොලැබෙන අවස්ථා පවතින අතර, එබැවින් එම මාර්ගය එක්සත් මාවත නමින් නම් කිරීමට යෝජනා කරන බව ද කෝපිවත්ත මාර්ගයේ කාහිංගල මහතාගේ නිවස ළඟ අතුරු මාර්ගය කාණුව සමඟ සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-06-10 දිනැති මුදල් කමිටු වාර්තාව**

1. PF-4006 කැබ් රථයේ ක්ලච් පද්ධතිය හා බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම හා එම වාහන නියෝජිත ආයතනය වන Toyota lanka PVT Ltd වෙතින් ඉදිරිපත් කර ඇති රු. 419,668.10 ක ඇස්තමේන්තුව අනුමත කර ගැනීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-06-01 සිට 2022-06-30 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,950,497.57 |
| වෙනත් ලැබීම් | 15,559,299.11 |
| මුලු ලැබීම් | 26,509,796.68 |
| පුනරාවර්තන වියදම් | 9,156,444.38 |
| වෙනත් වියදම් | 14,607,778.79 |
| මුලු වියදම් | 23,764,223.17 |

**2022-06-01 සිට 2022-06-30 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 27,140.00 |
| 227-5020 | 146,520.00 |
| RD - 8240 | 77,510.00 |
| VI1833 | 8,800.00 |
| 226-7521 | 21,620.00 |
| BC-0005 | |

| | |
|---|---|
| | 82,800.00 |
| GC 0001 | 3,780.00 |
| LL - 7688 | 25,300.00 |
| DPP 0006 | 13,600.00 |
| JD-4684 | 8,400.00 |
| ND-5124 | 66,700.00 |
| PF-4006 | 88,780.00 |
| QL-2901 | 6,720.00 |
| RC-1107 | 71,105.00 |
| RC 1118 | 79,580.00 |
| GK 1483 | |

| | |
|---|---|
| | 87,470.00 |
| ZA9835 | 7,250.00 |
| LL 2110 | 435.00 |
| SDRR 0013 | 1,840.00 |
| SDRRY0013 | 4,600.00 |
| UQ1933 | 8,400.00 |
| HF 7899 | 82,800.00 |
| OV/M 0017 43 | 19,780.00 |
| RC 8183 | 120,590.00 |
| RB 4786 | 9,200.00 |
| එකතුව | **1,070,720.00** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10:01 ගරු සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. වසන්ත ගුණරත්න මැතිතුමා**

**10:01:01** කිවුලවෙල පන්සල මාර්ගයේ ඇති පැති බැම්ම සංවර්ධනය කිරීම සඳහා වන ඇස්තමේන්තුව - රු.364,351.00

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් අඩු ආදායම්ලාභින් සඳහා සහන මලු බෙදා දීම යටතේ ලබා දුන් නම් සඳහන් අය හට සමෘද්ධි හා වෙනත් සහනාධාර සියල්ලම ලැබෙන බව පෙනී යන බැවින් ග්‍රාම නිලධාරී අනුමැතියකින් ලැබිය යුතු වෙනත් පුද්ගලයන්ව තෝරා එම අයව පෙර ලබා දුන් නම් වෙනුවට ආදේශ කිරීමට හැකිනම් එය සුදුසු බවට තමන් යෝජනා කරන බව ද ගෙවතු වගාව සඳහා ලබා දුන් අයදුම්පත්‍ර භාර ගැනීමේ කාලය දීර්ඝ කර දෙන ලෙස ද පවසන ලදී. එමෙන්ම

මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනා ක්‍රියාත්මක කිරීම නැවතුණු නමුත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය එම යෝජනා සඳහා ලබා ගැනීමට හැකි බව පැවසූ අතර, එය ක්‍රියාත්මක කළ හැකිදැයි විමසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගෙවතු වගා ව්‍යාපෘතිය යටතේ තම කොට්ඨාසයේ අයදුම්පත්‍ර ලබා දුන් සියලුම දෙනා මේ වනවිට ඉඩම් සුද්ධ කර පාත්ති සකස් කර අවසන් ව ඇති නමුත් නගර සභාවෙන් මේ වන තෙක් බීජ නොලැබුණු බව ද ඒ පිළිබඳව අවධානය යොමු කර හැකි ඉක්මනින් එම බීජ ලබා දීමට කටයුතු කරන ලෙස ද ඇවිදින මංතීරුව සඳහා සවස් කාලයේ පොලිස් නිලධාරියෙක් යෙදවීම සුදුසු බව ද ළමා උද්‍යානයේ තව කතුරු ඔංචිල්ලාවක් සවි කළ හැකි නම් එය වටිනා බව ද පැවසූ අතර, අඩු ආදායම්ලාභීන් සඳහා ලබා දෙන බඩු මලු 06 තමන් ලබා නොගත් නිසා එම වටිනාකම පොදු කටයුත්තකට යෙදවීමට ලබා දෙන්නේද යන්න විමසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් උඩකන්ද කරවිකැටිය මාර්ගයේ වීථි ලාම්පු නොමැති නිසා හොරකම් වැඩි වී ඇති අතර, දිගින් දිගටම මෙම ප්‍රශ්නය ඉදිරිපත් කළ නමුත් තවමත් විසඳුම් ලැබී නොමැති බව ද මහමෙව්නා මාර්ගයෙන් යන විට හමුවන අතුරු මාර්ගයේ කාණුවෙහි ජලය පිරී පවතින බැවින් ඩෙංගු රෝගය ව්‍යාප්ත වී ඇති අතර, එම කාණුවෙහි මිනිසුන් පිරිසක් විසින් ගල් පුරවා ඇති නිසා ජලය නිසි ආකාරයෙන් බැහැර නොයන බැවින් එම ගල් ඉවත් කර දෙන ලෙස ද උඩකන්ද පාර හංදියෙහි ඩොක්ටර්ගේ නිවස අසල කාණු කොටසක් ඉතුරු වී ඇති බැවින් එම ස්ථානය අනතුරුදායක වී ඇති බව ද පසු කාලයක හෝ එය සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම ගෙවතු වගාව සඳහා බීජ ඉක්මනින් ලබා දිය යුතු අතර, දුප්පත් ජනතාව සඳහා ලබා දෙන ලෙස පැවසුවත් වගා කිරීමට උනන්දුවක් දක්වන ඉඩ කඩ සහිත අය වෙත තමන් අයදුම්පත්‍ර ලබා දුන් බව ද අරගලය හේතුවෙන් රට අගාධයකට ඇද දැමූවන් එලවා දැමූ අතර, එම කාර්යයේදී අරගලය සිදු කල දරුවන් හා පොලිස්, හමුදා නිලධාරීන් ජීවිතක්ෂයට පත් වූ බව ද ඒ සම්බන්ධව තම කණගාටුව ප්‍රකාශ කරන අතර, බල ලෝභය හා මජර දේශපාලනය නිසා ඔලු ගෙඩි මාරුවීමක් මිස ප්‍රශ්නවලට විසඳුම් සෙවීම නොදකින බව ද ඉදිරියේ දී රට යම් ස්ථාවරත්වයකට පත් වේ යැයි අපේක්ෂා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් ග්‍රාම නිලධාරී එරංගා මධුවන්ති යන අය විසින් ඇයගේ කාර්යාලය අවට පිරිසිදු කර ගැනීම සඳහා කම්කරුවන් දෙදෙනෙකු ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ බව ද ගෙවතු වගා ව්‍යාපෘතිය යටතේ වගා කිරීමට උනන්දුවක් දක්වන අය වෙත අවශ්‍ය ද්‍රව්‍ය ලබා දිය යුතු අතර, අඩු ආදායම්ලාභීන් වුව ද කම්මැලි අයට ලබා දී ඵලක් නොමැති බව ද රටේ තත්ත්වය දෙස බලන විට රට අරාජික වී ඇති අතර, අනාගතය සුභ වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් "යා දිසං වපතේ බීජං -තාදිසං හරතේ ඵලං" ගාථාවෙහි අර්ථය අනුව අප වපුරපු දේ හි අස්වැන්න අප නෙලන බව සඳහන්ව ඇති බව ද මෙම අර්බුදය පිළිබඳව අවුරුදු 02 කට පෙර පැවසූ අතර, ප්‍රධානම ගැටලුව වී ඇත්තේ ඩොලර් නොමැතිකම බව ද තමාගේ කුඩා කාලයේ දී ශ්‍රී ලංකාවේ කර්මාන්ත ගණනාවක් පැවති අතර, 1982 වර්ෂයේ දී තෙල් පිරිපහදුව මඟින් නිෂ්පාදනය කළ යූරියා මෙ.ටො. 50,000.00 ක් පකිස්තානයට අපනයනය කළ බව ද එම කාලයේ දී නිවසට අවශ්‍ය කරන සියලුම දේ වගා කර තිබුණු අතර, 1977 න් පසු ඇති වුණු ආර්ථික ප්‍රතිපත්ති හා වෙනස්කම් හේතුවෙන් අද දින මෙම ප්‍රතිඵල අත් විඳින්නට සිදුව ඇති බව ද අප රට තුළ එළවළු, පලතුරු ඇතුළු බොහෝ නිෂ්පාදනයන් සිදු කළ හැකි අතර, විදේශ ණය නොතිබුණු රට තුළ මේ වන විට ඩොලර් බිලියන 51 ක විදේශ ණය පවතින නමුත් ආදායම ඩොලර් බිලියන 12 ක් පමණ වන බව ද මේ නිසා පවතින හිඟය හේතුවෙන් ණය ලබා ගන්නා බව ද පවසන ලදී.

එමෙන්ම අර්බුදවල කෙළවරක් නොමැති අතර, 69 ලක්ෂයක් ඡන්දය ලබා දුන් අය අද දින පෙළපාලි ගොස් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ජනාධිපති ධූරයෙන් ඉවත් වෙන ලෙස පවසන බව ද රට බේරා ගැනීම සඳහා පත් කළ එතුමා රටින් පැන ගොස් ඇති නමුත් වෙනත් රටවලට යාමේ දුෂ්කරතාවලට පවා මුහුණ දීමට සිදුව ඇති අතර ලංකා ඉතිහාසයේ මේ තරම් අපකීර්තියට පත් වූ ජනාධිපති කෙනෙකු නොමැති බව ද ඇමරිකාව විසින් රාජපක්ෂ පවුල විසින් උපයන ලද මුදල් ආයෝජන පවතින බව පවසන බව ද මෙම තත්ත්වය උද්ගත වීමට පෙර පොහොර ප්‍රශ්නය ඇතුළු ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලීම් කරමින් උද්ඝෝෂණ පැවති නමුත් රජය විසින් එම ප්‍රශ්නවලට විසඳුම් ලබා දීම වෙනුවට මර්දනය කිරීම හා ගනු ලැබූ තීරණ නිසා එම ප්‍රශ්න ව්‍යාකූල වී ඇති බව ද පොහොර නොමැති කම ආර්ථිකය බිඳ වැටීමට හේතුවක් වී ඇති බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධූරයට පත් වී මාස දෙකක් පමණ වන අතර, රාජපක්ෂ පවුලේ අර්බුදය විසඳීමට එතුමා පත් කර ගෙන ඇති බව ද එතුමා අවස්ථා 05 ක දී අගමැති වශයෙන් කටයුතු කර ඇති අතර, මෙම ප්‍රශ්න ව්‍යාකූල කළ නිර්මාපකයෙක් බව ද මාස 06 කට අප පක්ෂයට මෙම රට භාරදුනහොත් වැටුපක් හෝ දීමනාවක් නොගෙන ජනතාවගේ මූලික ප්‍රශ්න සඳහා විසඳුම් ලබා දෙන අතර, ඒ සඳහා ලෝකයේ රටවල් 51 ක පවතින අප පක්ෂයේ ශාඛා සමිති හා ව්‍යාපාරිකයන් අවශ්‍ය ඩොලර් ලබා දීමට පොරොන්දු වී සිටින බව ද ඒ සඳහා system change විය යුතු බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය කාලයේ දී අරගලකරුවන් අතර විවිධ ගැටුම් නිර්මාණය වූ අතර, එම ගැටුම් වෙනත් කණ්ඩායම් විසින් ඇති කළ සිද්ධීන් බව ද රූපවාහිනී සංස්ථාවට ඇතුළු වී යම් යම් නියෝග නිකුත් කිරීම් දුටු අතර, එම කණ්ඩායම නාමල් රාජපක්ෂගේ නිල් බලකායේ අය බවට තොරතුරු ලැබී ඇති බව ද විප්ලවයක් සිදු වන විට ප්‍රති විප්ලවයක් සිදු වන බව ද ජනතා විමුක්ති පෙරමුණෙහි යම් සාමාජිකයෙක් නිවාස ගිනි තැබීම් ආදී ක්‍රියාවන් සිදු කරන්නේ නම් පක්ෂය විසින් විනය ක්‍රියාමාර්ග ගන්නා බව ද සජිත් හෝ ෆොන්සේකා හෝ රනිල් හෝ රට භාර ගතහොත් මෙම තත්ත්වය තීව්‍ර වන නමුත් සමනය වීමක් සිදු නොවන බව ද පවසමින් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය ප.ව 1.00 ට සභාවෙන් පිටවන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා ප.ව 1.10 ට නැවත සභාවට පැමිණෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් අවුරුදු දෙක තුනක කාලයක් තිස්සේ අර්බුද රැසක් සිදු වූ අතර, පීඩාවට පත් ජනතාව විසින් අරගල කර යම්කිසි ප්‍රමාණයකින් රට මුදවාගෙන තිබෙන බව ද ඉදිරි මාස කිහිපය තුළ මෙම අර්බුදය ඇති වීමට පෙර භුක්ති විඳි පරිසරය හා සමාජ වටපිටාව ඇති කළ හැකි යැයි සිතන බව ද ජනතා විමුක්ති පෙරමුණෙහි ගරු නාගරික මන්ත්‍රීතුමා විසින් සිදු කළ කතාව රසවත් බව ද බහුතරයක් දෙනා අපේක්ෂා කරනු ලබන්නේ වංචාවෙන්, දූෂණයෙන් නාස්තියෙන් තොර රාජ්‍ය පාලනයක් බව ද පවසන ලදී.

එමෙන්ම පසුගිය සභාවේ යෝජනාවක් වශයෙන් අනුමත කරගෙන තිබෙන හාල් මලු බෙදා දීම සම්බන්ධව සභාව ආරම්භයේ දී අදහස් ප්‍රකාශ නොකර මෙම අවසන් අවස්ථාවේ දී මෙම දේ පවසන්නේ ගැටලුවක් ඇති නොකර ගනිමින් සාමාදානව විසඳා ගැනීමට හැකි වේයැයි සිතා බව ද ඒ අනුව සහල් කි.ග්‍රෑම් 2500 ක ප්‍රමාණයක් එකක් රුපියල් 240.00 බැගින් මිල දී ගැනීමටත් ඒ සඳහා රුපියල් ලක්ෂ 06ක මුදලක් වැය වන බවත් සඳහන්ව ඇති බව ද ගරු නාගරික මන්ත්‍රීවරයෙකුට සහල් 20kg මිටි 06 ක් වෙන් වන අතර, මන්ත්‍රීවරුන් 17 දෙනා සඳහා වෙන් වන සහල් ප්‍රමාණය 2040 kg බැවින් ඉතිරි සහල් 460 kg කුමක්ද වූයේ යැයි ප්‍රශ්නයක් පවතින බව ද රජයේ පාලන මිල රු.210.00 ක් හා රු. 220.00 ක් බවට ගැසට් කර තිබිය දී මෙම මිලට ගෙන ඇත්තේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසා විය හැකි නමුත් ධනසිරි මන්ත්‍රීතුමාගේ වෙළඳ ආයතනයෙන් මෙම සහල් ලබා ගෙන තිබීම සැකයක් බව ද එතුමා අද වන විටත් අලෙවි කරනු ලබන්නේ රු.210.00 ක මුදලකට බව ද මේ නිසා රු. 75,000.00 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව ද පවසන ලදී.

මේ සම්බන්ධව නිළධාරීන් නොදැනුවත්ව යම් කිසි දෙයක් වී ඇති බවට හා දේශපාලන අධිකාරියේ බලපෑමට නිලධාරීන් අවනත වූවා යැයි සැකයක් පවතින බව ද මහජන මුදලක් වියදම් කර හෝ ගසා කෑමකට ලක් කර ඇති අතර, සියලු දෙනාගේ හෘද සාක්ෂිය කුමක් ද වූයේ යැයි දන්නා බව ද අවශ්‍ය සියලු තොරතුරු තමන් විසින් රැස්කරගෙන පවතින අතර, පාරිභෝගික සේවා අධිකාරියෙන් උපදෙස් ලබා ගත් බව ද ඉදිරියේ දී විමර්ශන සඳහා කොළඹ මධ්‍යම දූෂණ මර්දන ඒකකයට යොමු කර ඇති බව ද පරීක්ෂණයකින් පසු සත්‍යතාවය සියලු දෙනාට පෙන්වා දෙන බව ද පැවසීය.

එමෙන්ම බළන්ගොඩ නගර සභාව ජනවාරි මාසයේ ගරු සභාපතිතුමා විසින් භාර ගන්නා විට රු.ලක්ෂ 300-400 ක පමණ ස්ථාවර තැන්පත් හා අනෙකුත් ගිණුම්වල සාධනීය මුදල් ප්‍රමාණයක් තිබුණු නමුත් අද වන විට පඩි ගෙවීමට නොහැකි තරමට ගිණුම් සිඳී ගොස් ඇති බව ද අක්‍රමවත් මුදල් පරිපාලනය හා ඊනියා සංවර්ධන කටයුතු ඒ සඳහා හේතු වී ඇති අතර, කඩිනම් සංවර්ධනය යැයි පැවසූව ද දකින්න කිසිවක් නොමැති බව ද නගර සභාවට සේවා සපයන ආයතනවලින් සභාවට ලැබෙන ගෞරවය නැති වී තිබෙන බව ද මාධ්‍යවේදීන් විසින් දෛනිකව ජනතාව දැනුවත් කිරීම සිදු කරන බැවින් සභාව තුල සිදුවන සියලු කාර්යයන් සමාජගත කර, සමාජය දැනුවත් කිරීම සිදු කරන ලෙස ඉල්ලා සිටින බව ද පවසමින් සියලුම දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

සහල් මිල දී ගැනීම සම්බන්ධව අදාල නිලධාරීන්ගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

## 12. අවසානය

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රට තුළ විශාල වෙනස්වීම් ගණනාවක් තුල මෙම සභාව පවත්වාගෙන ගිය අතර, පවතින පරිවර්තනයත් සමග අද සභාව අවසාන සභාව වීමට ඉඩ ඇති බව ද හිටපු ගරු සභාපතිතුමාට බහුතරය නොමැති නිසා සභාවෙන් ඉවත් වෙන ලෙස පැවසූ අතර, හිටපු ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හට ව්‍යවස්ථානුකූලව සිටීමට හැකියාව තිබුණු නමුත් එතුමා ඉවත් වූ බව ද දින 08කට පෙර ජනාධිපති මන්දිරයේ දී එතුමා මුණගැසී පෞද්ගලිකව කතා කිරීමට අවස්ථාව තමාට ලැබුණු බව ද එහි දී එතුමා කොතරම් සරල පුද්ගලයෙක් දැයි තේරුම් ගිය බව ද යම්කිසි පුද්ගල කණ්ඩායමකගේ උපදෙස් හා පවුලේ බලපෑම් මත වැරදි දිශාවකට යොමු වන්නට ඇති නමුත් එතුමා හොරකු නොවන බව තමන් විශ්වාස කරන බව ද 1971,1989 කාලයේ මෙන්ම එල්ටීටීඊ සංවිධානය මඟින් ද මර්දනය සිදු කලේ මිනිසුන් මරා දමමින් බව ද ගරු ජනාධිපතිතුමා හටද මිනිසුන් දහස් ගණන් මරා මේ රටින් යාමට හැකිව තිබුණු නමුත් එසේ නොකළ බව ද ඉදිරියේ ඩලස් අලහප්පෙරුම මැතිතුමා ජනාධිපති වී සජිත් ප්‍රේමදාස මැතිතුමා අගමැති වේ යැයි ආරංචි පවතින බව ද පවසන ලදී.

එමෙන්ම හිටපු ගරු සභාපතිතුමා විසින් තමන් පරිපාලනය හොඳින් කළ බව පැවසුව ද සභාපති ධූරයෙන් ඉවත් වී ගිය පසු මාස ගණනාවක් සභාවේ ලිපිගොනු නිවසේ තබා ගෙන සිටි බව ද වැරද්දක් කරන්නේ නම් එය පොඩි හෝ ලොකු දෙයක් වුවත් වැරැද්ද වැරද්දක්ම බව ද සභාවේ තිබූ පාපැදිය, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ගැන ගැටලු තිබෙන නමුත් පරීක්ෂණ නොකළ බව ද කාගේ අතින් වුව ද වැරදි අඩුපාඩු සිදු වන බව ද විනිවිදභාවයෙන් යුතුව සභාව සාර්ථකව කරගෙන යාමට කටයුතු කරන බව ද ඉදිරියේ දී තමන්ට සභාපති ධූරයෙන් ඉවත් වීමට සිදු වුවහොත් ව්‍යවස්ථා නීති නොබලා ඉවත් වන බව ද නිළධාරීන් වෙනුවෙන් තමන් මැදිහත් වන අතර මාධ්‍ය සම්බන්ධව මධ්‍යස්ථව බැලීමේ දී ඇතැම් මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය වගකීම නිසි ආකාරව වන්නේ දැයි ගැටලු ඇති වන බව ද අද මෙම රට මෙවැනි තත්ත්වයකට පත්වීමට මහා සංඝරත්නය, මාධ්‍ය, කතෝලික සභාව, මුස්ලිම් අන්තවාදීන්, දෙමළ ඩයස්පෝරාව මෙන්ම රාජපක්ෂ පාලනයේ අකටයුතුකම් හේතු වන්නට ඇති බව ද මේවායේ ප්‍රතිවිපාක යථා කාලයේදී විඳින්නට සිදුවන බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගී වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.2.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.